**බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.02.23

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.
06. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රූමි මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී යූ.එච්. ගාමිණී මැතිතුමා

**සහභාගී නොවූවෝ :-**

01. ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර ලේකම්

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන මහ සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා ලේකම් මහතා මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන්ම පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා , අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඓතිහාසික ජනවරමක් ලබාදෙමින් නැවතත් වසර 06 ක කාලයකට මේ රට පාලනය කිරීමේ බලය ලබා දී ඇති බැවින් , ශක්තිමත් පාර්ලිමේන්තුවක් පිහිටුවා රටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කර මේ රට සෞභාග්‍යමත් කිරීම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අපේක්ෂාව වී බැවින් , ඒ සඳහා අවශ්‍ය නෛතික බලය ලබාගැනීමට

පාර්ලිමේන්තුව විසුරුවා හැර 2010.04.08 දින පාර්ලිමේන්තු මහ මැතිවරණයක් පැවැත්වීමට තීරණය කර ඇති බව දැන්වීය.

මෙම මැතිවරණයේ දී ද අතිවිශිෂ්ඨ ජයක් එක්සත් ජනතා නිදහස් සංධානය ලබාගන්නා බව ගරු සභාපතිතුමා පැවසීය. මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයින්ට සහයෝගය ලබාදීම ප්‍රාදේශීය දේශපාලන නායකයින්ගේ වගකීම වන අතර ,විශේෂයෙන් බළන්ගොඩ ප්‍රදේශය නියෝජනය කරනු ලබන අපේක්ෂකයින්ගේ ජය තහවුරු කිරීමට සහයෝගය ලබාදිය යුතුවන බවත් , නාම යෝජනා භාරදීමේ අවසන් දිනය 25 හෝ 26 වන දිනට යෙදී ඇති බැවින් , මෙම නගර සභාවේ මාසික මහ සභා රැස්වීම අදදින පැවැත්වීමට තීරණය කල බව පැවසීය. එම හේතුව නිසා , ගරු මන්ත්‍රීතුන්ලා යම් අපහසුතාවකට පත්වූවා නම් , ඒ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන බව දන්වමින් , සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (03) 2010.01.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:

2010.01.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

## (04) පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

## 05. සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:

## 05:01 විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ප්‍රදානය - 2008/2009

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2008/2009 අධ්‍යයන වර්ෂවල විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා , විශ්ව විද්‍යාල අධ්‍යාපනට දිරිදීමක් වශයෙන් සභා අරමුදලින් රු.5000/- ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා අයදුම්පත් කැඳවන ලද අතර , එහි විස්තර පහත දක්වා ඇත.

| නම | ලිපිනය | අධ්‍යයන වර්ෂය | විශ්ව විද්‍යාලය | පාඨමාලාව |
|---|---|---|---|---|
| 01. කේ.එල්.නදීකා චතුරානී | ශෛලතලාරාම මාවත, අනඳමෙත්ගම , බළන්ගොඩ | 2008/2009 | කැළණිය විශ්ව විද්‍යාලය | කලා |
| 02. ඒ.ඩබ්.තාරිකා නෙලුම් ප්‍රියදර්ශනී | 851 , ඇල්ලෙපොල , බළන්ගොඩ | 2008/2009 | කැළණිය විශ්ව විද්‍යාලය | කලා |
| 03. එම්.ඒ.ඩී.චතුරංග මාධව | දුනුගහමඩලවත්ත , මිරිස්වත්ත, බළන්ගොඩ | 2008/2009 | කොළඹ විශ්ව විද්‍යාලය | කළමනාකරණ |
| 04. එම්.එම්.ජයශාන් නිල්රුවන් | 93, සුදර්ශනගම , බළන්ගොඩ | 2008/2009 | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | කළමනාකරණ |

| | | | | |
|---|---|---|---|---|
| | ,තුඹගොඩ | | | |
| 05. ජී.ජී.නඳුන් ඉරෝෂණ වීරරත්න | 970 , මෙගොඩ කිරිඳිගල , බළන්ගොඩ | 2008/2009 | කොළඹ විශ්ව විද්‍යාලය | කළමනාකරණ |
| 06. චතුලියා කල්හාරී දෙනිපිටිය | අංක.10, අනඳමෙත්ගම, බළන්ගොඩ | 2008/2009 | රුහුණු විශ්ව විද්‍යාලය | ඉතිහාසය |
| 07. එම්.එස්.එෆ්.මිස්රා | 205/6 , ගොරොක්ගහමඩ, බළන්ගොඩ. | 2008/2009 | දේශීය වෛද්‍ය ආයතනය | යුනානි |
| 08. මොහොමඩ් අමීන් ෆාතිමා ඉර්ෆාම් | 37,රාස්සගල පාර ,බළන්ගොඩ | 2008/2009 | ත්‍රිකුණාමලය විශ්ව විද්‍යාලය | සන්නිවේදන |
| 09. මොහොමඩ් සෆීර් මොහොමඩ් රිනාස් | 307, කල්තොට පාර ,බළන්ගොඩ | 2008/2009 | පේරාදෙනිය විශ්ව විද්‍යාලය | කළමනාකරණ |

මේ පිළිඳව සලකා බැලූ සභාව , පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව , සභා අරමුදලින් ඉහත සඳහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට රු. 5000/- බැගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

05:03 **නව නගරයේ ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතියේ ජලය රඳා පැවතීම:**

බළන්ගොඩ නව නගරයේ ප්‍රධාන මාර්ගයේ පැරණි ගල්වල තිබූ ස්ථානයේ සිට දොරවෙල ගම දක්වා ඇති කොන්ක්‍රීට් කාණු පද්ධතියේ වැසි ජලය පිරී පවතින නිසා මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවය ඉතා දැඩි ලෙස පවතින අතර , මේ හේතුවෙන් දොරවෙල ගම්වාසීන් හට ඩෙංගු උවදුරට මුහුණ පෑමේ අවදානමක් පවති. එබැවින් , මෙම මාර්ගයේ කාණු පද්ධතිය හැකි ඉක්මණින් ශුද්ධ පවිත්‍ර කර ජලය බැසයාමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා , ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

යථෝක්ත කාරණය මහා මාර්ග සංවර්ධන අධිකාරියෙහි අවධානයට ලක්කිරීමට සභාව තීරණය කරන ලදී.

05:04 **ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාගැනීම:**

බළන්ගොඩ , ඕළුගන්තොට , " මිණි කිරණ " ක්‍රීඩා සමාජයේ ක්‍රීඩාපිටිය සකස් කිරීම සඳහා මෙම නගර සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාදෙන මෙන් ඉල්ලා , එම ක්‍රීඩා සමාජයේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ප්‍රදේශයේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලීමට දායකත්වය ලබාදිය යුතු වන බැවින් , නොමිලයේ මෙම සේවාව ලබාදීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:05 **තලංගම පාසල ළඟ ඇති රජයේ ඉඩමට හා කාර්යාල වලට ඇතුළු වන ස්ථානයට බෝක්කුවක් ලබාගැනීම:**

උක්ත කරුණට අදාළව , බළන්ගොඩ අංක: 10, රන්දොල උයනගම යන ලිපිනයේ පදිංචි එම්.ජේ.එස්.මිගෙල් ආරච්චි යන අය විසින් එවා ඇති 2009.11.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

යථෝක්ත ස්ථානයන්ට පිවිසීම සඳහා කාණුව සකස් කරන විට එම ස්ථානයට හියුම් පයිප්ප දෙකක් යොදා වාහන ගමනා ගමනයට පහසු වන අන්දමින් එය සකස්කරන මෙන් ප්‍රදේශවාසීන් වෙනුවෙන් ඉල්ලීමක් කරන බව එමගින් දන්වා තිබිණ.

හියුම් පයිප්ප ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **කොන්ත්‍රාත්කරුවකු හා සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම - 2010**

බළන්ගොඩ , අංකඃ 174 , උඩඅරාව යන ලිපිනය සඳහන් ජේ.සී.කන්ස්ට්‍රක්ෂන් ආයතනය මෙම නගර සභාවේ කොන්ත්‍රාත්කරුවකු හා සැපයුම්කරුවකු ලෙස 2010 වර්ෂය සඳහා ලියාපදිංචි කරන මෙන් ඉල්ලා එම ආයතනයේ කළමනාකරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත සඳහන් ආයතනය 2010 වසර සඳහා මෙම නගර සභාවේ කොන්ත්‍රාත්කරුවකු හා සැපයුම්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **ආගමික උත්සවයක් පැවැත්වීමඃ**

බළන්ගොඩ , කිරිදිගල ශාන්ත ජෝශප් දේවස්ථානයේ දී 2010 මාර්තු මස 10,11 දෙදින තුළ ඉතාලියේ පාදුවා නගරයේ සිට ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ගේ ධාතු වැඩමකරවීමත් , ඊට ගරු බුහුමන් දැක්වීමත් , කිරිදිගල ශාන්ත ජෝශප් දේවස්ථානයේ දී සිදුකිරීමට නියමිත අතර , එම උත්සවයට අතිවිශාල ජනතාවක් සහභාගීවනු ඇතැයි අපේක්ෂා කරන බැවින් , ඒ සඳහා පහත සඳහන් පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලා , දේවස්ථාන භාරකාර පියතුමා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. උත්සවයට සහභාගීවන ජනතාවට ජලය ලබාදීම සඳහා ජල බවුසරයක් ලබාගැනීම.
02. කුණු කසල එකතු කිරීම සඳහා භාජන 10 ක් ලබාගැනීම
03. වැසිකිළි පහසුකම් ලබාදීම සඳහා පොළව සකස් කිරීමට බැක්හෝ යන්ත්‍රය පැය 03 ක කාලයකට ලබාදීම.

ආගමික කටයුත්තක් වන බැවින් , මෙම පහසුකම් නොමිලයේ ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:08 **මහ නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ නගරාධිපති/උප නගරාධිපති/ සභාපති/උපසභාපති හා මන්ත්‍රීවරුන් වෙත ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ගෙවීමඃ**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කර ඇති 1999.07.30 දිනැති , අංකඃ පපාකො/ඩී/දරණ චක්‍රලේඛය අවලංගු කර , 2009.12.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සංශෝධනයන් සිදුකරන බව දන්වමින් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2009.12.22 දිනැති චක්‍රලේඛය ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

1. රත්නපුර මහ නගර සභාවේ නගරාධිපතිතුමාට , නගර සභාවල හා ප්‍රාදේශීය සභාවල සභාපතිතුමන්ලාට ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සම්පූර්ණ දිනකට රු.500/- ක සංයුක්ත දීමනාවක් ද ,

ii. රත්නපුර මහ නගර සභාවේ උප නගරාධිපතිතුමාට , නගර සභාවල හා ප්‍රාදේශීය සභාවල සභාපතිතුමන්ලාට ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සම්පූර්ණ දිනකට රු.400/- ක සංයුක්ත දීමනාවක් ද ,

iii. රත්නපුර මහ නගර සභාවේ , නගර සභාවල හා සහ ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීතුමන්ලාට ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සම්පූර්ණ දිනකට රු.350/- ක සංයුක්ත දීමනාවක් ද ගෙවිය යුතුය.

ඉහත සඳහන් සංයුක්ත දීමනාව ගෙවනු ලබන්නේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙන් පිට රාජකාරී ගමන් බිමන් සඳහා පමණකි. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව මෙම ගෙවීම් කල යුතුය.

ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා ලබාගැනීමට හැකිවන්නේ අදාළ පළාත් පාලන ආයතනයේ පරිපාලන කටයුතු වලට කෙළින්ම සම්බන්ධ රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණි. පරිපාලන කටයුතු වලට සම්බන්ධ නැති යම්කිසි උත්සවයක් සම්මන්ත්‍රණයක් හෝ රැස්වීමකට සහභාගීවීමට යාම වෙනුවෙන් පළාත් පාලන ආයතනයේ අරමුදලින් ගමන් වියදම් හෝ / සංයුක්ත දීමනාව හෝ ලබාගැනීමට හිමිකමක් නොමැත. එවැනි ගෙවීම් විගණකාධිපති විසින් පූර්ණ ගාස්තුවක් වශයෙන් අයකර ගැනීමට ඉඩ ඇති බැවින් මෙම ගමන් ගාස්තු හා සංයුක්ත දීමනා අදාළ පළාත් පාලන ආයතනයේ අරමුදලින් දැරිය යුතු බවට මෙමගින් අවධාරණය කර තිබුණි. මේ සඳහා සභා අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08 රජයේ සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම:**

උක්ත කරුණට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපති ලේකම් , අග්‍රාමාත්‍ය ලේකම් , අමාත්‍ය මණ්ඩල ලේකම් , සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් , සියළුම පළාත් සභ ප්‍රධාන ලේකම්වරුන් , සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සියළුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් හා සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත යවන ලද මැතිවරණ කොමසාරිස්වරයාගේ අංක: පීඊ/2010/04 හා 2010.02.13 දිනැති ලිපියෙහි පිටපතක් දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

05:10 **වැසිකිලිය සාදාගැනීම:**

බළන්ගොඩ ෆලීල් හාජ්ජියාර් මාවතේ පිහිටි " හල්හිරා " පෙර පාසලේ වැසිකිලිය සාදා ගැනීම සඳහා උපකාර කරන ලෙස ඉල්ලමින් , එම පෙර පාසලේ පාලිකාව විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම පෙර පාසල නගර සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යන්නක් බැවින් පහත සඳහන් අයිතමයන් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

01. උළුවස්ස හා දොර } පාවිච්චි කල
02. ලෑලි ස්ලැබ් එක සඳහා }
03. 2 ' පොලු 06
04. සක්ක කියුබ් 1/4

05:11 **පෙර පාසලට භාණ්ඩ ලබාගැනීම :**

බළන්ගොඩ නගර සභා පෙර පාසලට පහත සඳහන් භාණ්ඩ ලබාදෙන ලෙස ඉල්ලා නගර සභා පෙර පාසලේ පාලිකාව විසින් එවා ඇති 2010.02.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

01. ත්‍රිපෝෂ සෑදීම සඳහා බේසම් 02

02. වතුර උණු කිරීම සඳහා විදුලි කේතලයක්

03. ජොගුවක්

04. හැඳි 02

05. ප්ලාස්ටික් බෝනික්කෝ 20

06. බිල්ඩින් සෙට් 25

07. කැසට් රේඩියෝ යන්ත්‍රයක්

මිළ ගණන් කැඳවා අදාල භාණ්ඩ මිළදී ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:12 **සබරගමුව පළාත් පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පිහිටුවීම:**

උක්ත කරුණට අදාළව සබරගමුව පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය හා පළාත්පාලන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

පළාත් පාලන හා පාසැල් පද්ධතිය මගින් පොදු ජනතාවට සිදුකරනු ලබන පුස්තකාල සේවාවන් වඩා ඵලදායීවත් කාර්යක්ෂමවත් සිදුකිරීම සඳහා පුස්තකාල සේවාවට අදාළ මානව සම්පත් සංවර්ධනය , තාක්ෂණික සේවාවන් සඳහා සහයාවීම හා සම්පත් මධ්‍යස්ථානයක් ලෙස පළාත තුළ පිහිටි සියළු පුස්තකාල වලට සේවාවන් සැපයීමේ අරමුණින් පළාතට මේ දක්වාම අඩුපාඩුවක්ව පැවති පුස්තකාල සේවා මණ්ඩලය 2010 මාර්තු මස අග භාගයේ දී අතිගරු ජනාධිපතිතුමා විසින් විවෘත කිරීමට තීරණය කර ඇත.

මෙම මධ්‍යස්ථානය තුළ 1 ශ්‍රේණියේ පුස්තකාලයක් පිහිටුවන බැවින් , ඒ සඳහා සුවිශාල පොත් ප්‍රමාණයක් මිළදී ගත යුතු බැවින් , මෙම නගර සභාවෙන් ද රු.50000/- ක දායකත්වයක් ලබාගැනීමට අදහස් කරන බැවින් , එම මුදල චෙක්පතකින් 2010.02.28 දිනට පෙර සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා තිබිණ.

මෙම මුදල ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:13 **R.B.4786 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම:**

සබරගමුව පළාත් සභාවෙන් ත්‍යාගයක් ලෙස ලැබුණු ඉහත අංක දරණ ට්‍රැක්ටර් රථය සෞඛ්‍ය අංශයේ සේවය සඳහා යෙදවීමට නියමිත බැවින් , එම රථයට පහත සඳහන් උපාංග අළුතින් සවිකල යුතුව බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

01. ඇන්ජිම කොටසට අලුතින් ටෙන්ට් රෙද්දක් යොදා වහලය ගැසීම
02. පැති කණ්ණාඩි 02 සවිකිරීම
03. සෞඛ්‍ය අංශයට අදාල සයිරන් හෝන් එකක් සවිකිරිම
04. ට්‍රේලරයේ කසල කසල ඉවත්කිරීමට සුදුසු පරිදි සකස් කිරීම.

මිළ ගණන් කැඳවා අදාල කාර්යයන් සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:14 **දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

රජයේ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයක් වු දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සඳහා සහභාගීවන ලෙස සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමා විසින්කරන ලද දැනුම්දීමකට අනුව සබරගමුව පළාත් සභාව වෙනුවෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රදර්ශනකුටියක් මෙම නගර සභාව මගින් ඉදිරිපත් කරන ලදී.

මෙම ප්‍රදර්ශනය කුටිය අලංකාරව නැවත සකස් කිරීම සඳහා මිළ ගණන් කැඳවු අතර , එම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කල සෙන්සර් ආයතනයේ වජිර සංජීව විජේකෝන් මහතාගෙන් අදාල සේවාව ලබාගන්නා ලද බැවින් , ඒ වෙනුවෙන් ඔහු වෙත රු.105000/- ක මුදලක් ගෙවීමට ඇති බව එමගින් දන්වා තිබිණ.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:15 **වරිපනම් බද්දෙන් නිදහස් කිරීම - අංකඃ193 පෙට්ටිගල පාර ඃ**

බළන්ගොඩ ,පෙට්ටිගල පාර අංකඃ 193 දරණ ස්ථානයේ පවත්වාගෙන ගිය වී මෝල ගලවා ඉවත් කර ඇති බැවින් , වරිපනම් බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා , බළන්ගොඩ පෙට්ටිගල පාර අංකඃ 193 දරණ ලිපිනයේ පදිංචි එම්.සිරිපාල මහතා විසින් ඉදිරිපත් කර ඇති 2009.12.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එම ස්ථානයේ වීමෝලක් නොමැති බැවින් , 2010 වර්ෂය සඳහා අයකල යුතු වු වරිපනම් බද්දෙන් අඩක් පමණක් අයකිරීමට සභාව තීරණය කරන ලදී.

05:16 **වරිපනම් බද්දෙන් නිදහස් කිරීම ඃ**

බළන්ගොඩ , තුඹගොඩ අංකඃ 47 දරණ වෙළඳසැල දැනට වසා ඇති බැවින් , ඒ සඳහා අයකරනු ලබන වරිපනම් බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා , බළන්ගොඩ , තුඹගොඩ , අංකඃ 47 දරණ ලිපිනයේ පදිංච ඒ.බී.සරත්සිරි සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

2010 වර්ෂය සඳහා ගෙවිය යුතු වරිපනම් බද්දෙන් අඩක් පමණක් අයකිරීම සුදුසු බව සභාව තීරණය කරන ලදී.

05:17 **බස්නැවතුම්පල කඩ කාමර සඳහා ගිවිසුම් අත්සන් කිරීමඃ**

බස්නැවතුම්පල උඩුමහලේ පිහිටි ටෙන්ඩර් මගින් බඳුලබා නොගත් කඩ කාමර මාසික කුලී පදනම මත බදු දී ඇති අතර , මෙම කඩ කාමර සඳහා වාර්ෂිකව ගිවිසුම් අත්සන් කිරීම පිළිබඳවත් , මෙම ගිවිසුම් නගර සභාව මගින් පිළියෙල කිරීම පිළිබඳවත් සලකා බැලීම පිණිස ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

නගර සභාව මගින් ගිවිසුම් සකස් කර වාර්ෂිකව ගිවිසුම් අත්සන් කිරීමට තීරණය කරන ලදී. අදාල කඩහිමියන් සභාවට කැඳවා නිලවශයෙන් බදු ගිවිසුම්පත් ප්‍රදානය කිරීමේ කාර්යය සිදුකිරීමට ද තීරණය විය.

05:18 **විදුලි සම්බන්ධතාව ලබාගැනීමඃ**

බළන්ගොඩ , ආනන්ද මෛත්‍රීය මාවත, " වීර උදාර " ජල පාරිභෝගික සමිතිය වෙත විදුලිය ලබාගෙන තිබෙන ආකාරය විධිමත් නොවන බව විදුලිබල මණ්ඩය විසින් දන්වා ඇති අතර , විධිමත් ආකාරයට විදුලි සමබන්ධතාව ලබාගැනීම සඳහා විශාල මුදලක් වැයවන අතර , අඩු ආදායම්ලාභීන් වන බැවින් , එම මුදල ගෙවීම අපහසු බැවින් , ඒ සම්බන්ධව සභාවේ

අවධානය යොමු කර විදුලි ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස එම සමිතියේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

විදුලිය සම්බන්ධතාවය ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:19 **පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට ලිපිද්‍රව්‍ය ලබාදීම:**

බළන්ගොඩ නගර සභාවේ කාර්ය සාධනයට අදාළ මාතෘ හා ළමා සෞඛ්‍ය රැකවරණයට අදාළ තොරතුරු ලබාගැනීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර අති බැවින් , ඒ සඳහා සහයෝගය ලබාගනු පිණිස බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සේවය කරනු ලබන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට වර්ෂයකට රු.1000/- ක ලිපි ද්‍රව්‍ය ලබාදීම සුදුසු බව දන්වමින් , 2010.02.22 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

නගර සභා සීමාව තුළ සේවය කරන පවුල සෞඛ්‍ය සේවා නිලධාරීන්ට පමණක් ලබාදීමට තීරණය කරන ලදී.

05:20 **හිඟ දුරකථන ගාස්තු අයකිරීම:**

බළන්ගොඩ නගර සභාව නමින් ලබාගෙන ඇති අංක: 060-2455750 දරණ ගරු විමලසේන මන්ත්‍රීතුමාට අයත් දුරකථනය සඳහා 2006.09.12 දින සිට මේ දක්වා රු.48389.54 ක මුදලක් ගෙවීමට ඇති බැවින් , මේ සම්බන්ධව සාකච්ඡා කිරීම පිණිස ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ගරු මන්ත්‍රීතුමාගේ දීමනාවෙන් 50% ක මුදලක් අයකරගගෙන මුදල් යැවීමට ගරු මන්ත්‍රීතුමාගේ එකගතාවය අනුව තීරණය කරන ලදී.

05:21 **නගර සැලැස්ම සැකසීම:**

බළන්ගොඩ නගර සැලැස්ම සැකසීම වෙනුවෙන් කැඳ වූ මිල ගණන් 2009.12.24 දින මහ සභාවට ඉදිරිපත් කල අතර , එහි දී අවම මිළ ඉදිරිපත් කර තිබූ වජිර සංජීව විජේකෝන් යන අයගෙන් මිළ ගණන සභාව විසින් අනුමත කරන ලදී. ඒ අනුව , නගර සැලැස්ම සැකසීම වෙනුවෙන් ඔහු විසින් ඉල්ලන ලද 20% අත්තිකාරම සඳහා රු.55,000/- මුදලක් මේ වන විට සභාව මගින් ගෙවා ඇත. ඔහුට ගෙවිය යුතු ඉතිරි මුදල වන රු.220000/- ක මුදල ලබාගැනීම සඳහා බිල්පතක් ඉදිරිපත් කර ඇති බැවින් , එය ගෙවීම සඳහා සභාවේ අනුමැතිය පතා ඉදිරිපත්කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:22 **සමස්ථ ලංකා සංගීත සහ නාට්‍ය තරගාවලියට සිසුන් සහභාගීකරවීම සඳහා අනුග්‍රහය ලබාගැනීම :**

උක්ත කරුණට අදාළව , බළන්ගොඩ ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලයේ සිසු දරු දැරියන් විසින් ඉතිහාසයේ ප්‍රථමවරට පළාත් තරග ඉසව් තුනකින් ප්‍රථම ස්ථානය ලබා ජයග්‍රහණය කර ඇති අතර , එම තරග සඳහා සිසුන් සහභාගීවූයේ ද විවිධ දුෂ්කරතා මධ්‍යයෙහිය. සමස්ථ ලංකා මට්ටමෙන් පැවැත්වෙන තරග සඳහා සහභාගීවීමට , මෙම දරු දැරියන්ට සංගීත උපකරණ සකස් කරගැනීමට , ඇඳුම් පැළඳුම් සකස් කරගැනීම සහ ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම ආදී කටයුතු සඳහා රුපියල් තිස් දෙදහසක පමණ මුදලක් වැයවෙතැයි ගණන බලා ඇති අතර , දෙමාපියන්ට මෙවැනි විශාල මුදලක් උපයා ගැනීමේ දුෂ්කරතාවයක් පවතින බව දන්වා ඇති බැවින් ,

මේ සඳහා ප්‍රදේශයේ අනුග්‍රාහකයින්ගේ සහය ලබාගැනීමට අදහස් කර ඇති බවඑමගින් දන්වා තිබුණි.

පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව රු.10,000/- ක මුදලක් සභා අරමුදලින් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:22 **වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය අවසාන සමීක්ෂණ කටයුතු :**

බළන්ගොඩ නගර සභාවේ වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන අවසාන සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නව නිලධාරී මහතුන් දෙදෙනෙකු පත්කර ඇති අතර , ඔහුන්ගේ සහය සඳහා තවත් සහායක සේවකය මහතුන් දෙදෙනෙකුගේ සේවය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාළ කාර්යය සඳහා තවත් සේවකයින් දෙදෙනෙකු සහය ලබාගැනීමට සභාව තීරණය කරන ලදී.

05:23 **බස්නැවතුම්පල විදුලිය පද්ධතිය අළුත්වැඩියා කිරීම:**

බස්නවතුම්පල විදුලිය පද්ධතිය අළුත්වැඩියා කිරීමේ වැඩ කොටස් වලට ගෙවීම සඳහා විදුලි කාර්මිකයින් ඉදිරිපත් කරන ලද බිල්පත , උපදේශක ඉංජිනේරුගේ නිර්දේශයන් පරිදි සංශෝධනයන් සහිතව ඉදිරිපත් කර ඇති බැවින් , බිල්පතට අදාල ගාස්තු හා උපදේශක සේවා ගාස්තු ගෙවීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාළ සේවාව වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් ප්‍රමාද වී ඇති බැවින් වහාම ගෙවීමට සභාව තීරණය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම : 2010.01.19 සිට 2010.02.12 දින දක්වා ( රු.10000/-ට වැඩි ගෙවීම් )**

පොදු ගිණුම

| දිනය | විස්තරය | ව.අ. | චෙක් අංකය | මුදල |
|---|---|---|---|---|
| | තාවකාලික වැටුප් - කර්මාන්ත අංශය<br>තානායම ආරක්ෂක වැට 69875/-<br>ළදරු පාසල් ගොඩනැගිල්ල 67500/-<br>තානායම අලුත්වැඩියාව 32875/-<br>බෝම්බුව පන්සල පාර 9500/-<br>වැව්වත්ත ප්‍රජාශාලාව 13500/-<br>පෙට්ටිගල පාර 2000/-<br>බෝම්බුව වැලිගල මාවත 2500/-<br>වතුකාරගොඩ පාර 2000/-<br>බෝම්බුව ගඟ පාර 2000/-<br>බෝම්බුව ආචාරිමලේ පාර 2000/- | 46.2 | 653951 | 203750.00 |
| | නිව් ලක්මාලී ෆනිචර්ස්<br>බළන්ගොඩ තානායම සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ මිළදි ගැනීම | 47 | 653952 | 141000.00 |

<table>
<tr><td></td><td>
<table>
<tr><td>විස්තරය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>මුදල</td></tr>
<tr><td>Teak Wood Wardobe 4 ½'x6 ½'</td><td>48000/-</td><td>01</td><td>48000/-</td></tr>
<tr><td>Teak Wood bed 6'x6 ½'</td><td>22000/-</td><td>01</td><td>22000/-</td></tr>
<tr><td>Dressing tabie</td><td>22000/-</td><td>01</td><td>22000/-</td></tr>
<tr><td>Bed Side Cupboard</td><td>5000/-</td><td>01</td><td>5000/-</td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>Towel Rack</td><td>2500/-</td><td>01</td><td>2500/-</td></tr>
<tr><td>Keta Kella tabie With four Chais</td><td>22000/-</td><td>01</td><td>22000/-</td></tr>
<tr><td>Teak Wood bed 3'x6 ½'</td><td>1100/-</td><td>01</td><td>11000/-</td></tr>
<tr><td>Transport Charges</td><td></td><td></td><td>8500/-</td></tr>
<tr><td></td><td></td><td></td><td>141000/-</td></tr>
</table>
</td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>බී.ගුණරත්න<br>2010.01.01 සිට 2010.01.15 දින දක්වා නගරයේ කැළි කසල එකතු කිරීමට හා ප්‍රවාහනය කිරීම සඳහා කම්කරුවන් යෙදවීම</td><td>48</td><td>653953</td><td>100583.33</td></tr>
<tr><td>1.20</td><td>කේ.ඩී.නිශාන්ත<br>කාර්යාලීය දුරකථන පද්ධතියේ වෙනස් කිරීම් කිහිපයක් කිරීම සඳහා මුදල් ගෙවීම</td><td>52</td><td>653956</td><td>13650.00</td></tr>
<tr><td></td><td>ජේ.ජී.පී.වික්‍රමසිංහ<br>මහජන පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට දෙසැම්බර් මස පුවත්පත් සැපයිම වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>56</td><td>653959</td><td>16130.00</td></tr>
<tr><td></td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2009 දෙසැම්බර් මාසයේ දුරකථන බිල පියවීම
<table>
<tr><td>දුරකථන අංකය</td><td>මුදල</td></tr>
<tr><td>2287275</td><td>6635.09</td></tr>
<tr><td>2287153</td><td>2943.33</td></tr>
<tr><td>2286596</td><td>3229.53</td></tr>
<tr><td>2288737</td><td>7433.63</td></tr>
<tr><td>E-mail</td><td>230.92</td></tr>
</table>
</td><td>57</td><td>653960</td><td>20472.50</td></tr>
<tr><td></td><td>එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් ලබාගැනීම
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>6'x9" ගල්</td><td>2300/-</td><td>කි.10.77</td><td>24771.00</td></tr>
<tr><td>1'ගල්</td><td>4600/-</td><td>කි.01</td><td>4600.00</td></tr>
<tr><td>1 ½ ගල්</td><td>4400/-</td><td>කි.02</td><td>8800.00</td></tr>
<tr><td>¾ ගල්</td><td>4800/-</td><td>කි.02</td><td>9600.00</td></tr>
<tr><td>½ ගල්</td><td>3300/-</td><td>කි.03</td><td>9900.00</td></tr>
</table>
</td><td>59</td><td>653961</td><td>57671.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 1/20 | රිෂානා සර්විස් ස්ටේෂන්<br>අංකඃ227-5020 දරණ ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 61 | 653963 | 10415.00 |
| | කළමනාකරු , මහජන බැංකුව,බළන්ගොඩ<br>කොම්පෝස්ට් ව්‍යාපෘති ගිණුමට බැරවිය යුතුව තිබූ මුදල් 017-100 10-6351750 දරණ පොදු ගිණුමේ තැන්පත් වී තිබූ නිසා එම මුදල ආපසු අදාල ගිණුමට බැරකිරීම | 62 | 653964 | 52785.25 |
| 1/22 | ඩබ්.එස්.පැකේජින්<br>2010 වසර සඳහා අයවැය ලේඛනයේ පිට කවර 50 සහා ලේටර් හෙඩින්ස් 5000 වෙනුවෙන් ගෙවීම<br><br>වර්ගය \| එකක මිල \| ප්‍රමාණය \| වටිනාකම<br>ලෙටර් හෙඩින්ස් \| 2.10 \| 5000 \| 10500.00<br>පිට කවර \| 292.50 \| 50 \| 14625.00 | 67 | 653996 | 25125.00 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 68 | 653997 | 30730.84 |
| | ඩබ්.එස්.වීරවංශ<br>බළන්ගොඩ නගර සභා ළදරු පාසල් ගොඩනැගිල්ලට අලුතින් කොටසක් එකතු කිරීම කර්මාන්තයේ වැඩ කුළිය ගෙවීම | 70 | 653999 | 61340.00 |
| 1/22 | තාවකාලික වැටුප් ගෙවීම<br>නගර සභා බලප්‍රදේශයට අලුතින් එක් වු දේපල තක්සේරු කිරිමේ දී සහයකයින් සඳහා දීමනා ගෙවීම | 71 | 654000 | 45000.00 |
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>ඇල්ලෙපොල මාලිගාතැන්න කඩේ අසලින් ඉහල පාර සරස්වතීවත්ත පාර සුසාන භූමිය ඉහල කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම අවසන් කොටස කර්මාන්තයේ 10% රැඳවුම් ගෙවීම හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 72 | 651901 | 82500.00 |
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>ආනන්ද මෛත්‍රී මාවත සිට සුදර්ශනගම 1 පටුමග කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම 10% රැඳවුම් ගෙවීම තැන්පත් ආපසු ගෙවීම<br>අවසන් ගෙවීම 45000/-<br>10% රැඳවුම් 25000/-<br>තැන්පත් 12500/- | 73 | 651901 | 82500.00 |
| 1/22 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>වැලිහරනාව පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය<br>අවසන් කොටස ගෙවීම 45000/-<br>10% රැඳවුම් 25000/-<br>කොන්ත්‍රාත් ගිවිසුම් ඇප 12500/- | 74 | 651902 | 82500.00 |

<table>
<tr><td></td><td>සභාපති , කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>තුඹගොඩ කෝපිවත්ත රණවිලාවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය<br>අවසන් කොටස ගෙවීම 45000/-<br>10% රැඳවුම් 25000/-<br>කොන්ත්‍රාත් ගිවිසුම් ඇප 12500/-</td><td>75</td><td>651902</td><td>82500.00</td></tr>
<tr><td></td><td>සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය<br>සඳුන්ගම මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය<br>අවසන් කොටස ගෙවීම 45000/-<br>10% රැඳවුම් 25000/-<br>ගිවිසුම් ඇප තැන්පත් 12500/-</td><td>76</td><td>651903</td><td>82500.00</td></tr>
<tr><td></td><td>සභාපති , තුඹගොඩ ගොවි සංවිධානය<br>සමගි මාවත අක්කර 18 ගරාජය අසල අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම<br>අවසන් කොටස ගෙවීම 45000/-<br>10% රැඳවුම් 25000/-<br>ගිවිසුම් ඇප තැන්පත් 12500/-</td><td>77</td><td>651903</td><td>82500.00</td></tr>
<tr><td>1/22</td><td>සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය<br>පල්ලෙවෙල ළිඳ අසල අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම<br>අවසන් කොටස ගෙවීම 45000/-<br>10% රැඳවුම් 25000/-<br>ගිවිසුම් ඇප තැන්පත් 12500/-</td><td>78</td><td>651904</td><td>82500.00</td></tr>
<tr><td>1/28</td><td>කළමනාකරු ලංකා බැංකුව,බළන්ගොඩ<br>2009.11.26 දින ලංකා බැංකු ගිණුමෙන් පොදු ගිණුමට බැර කල රු.4000000/- න් රු.2000000/- ආපසු බැර කිරීම</td><td>80</td><td>651910</td><td>2000000.00</td></tr>
<tr><td></td><td>පී.එස්.ටයර් වර්ක්ස්<br>එන්.ඩී.5124 දරණ වෑන් රථය සඳහා බැටරියක් මිළදී ගැනීම</td><td>85</td><td>651915</td><td>14950.00</td></tr>
<tr><td></td><td>නිව් ශාශෝධය ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ලේඛන සපයා ගැනීම
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඉන්වෙන්ට්‍රි ලේඛන</td><td>450</td><td>05</td><td>2250/-</td></tr>
<tr><td>බලපත්‍ර ගාස්තු ලේඛන</td><td>850</td><td>02</td><td>1700/-</td></tr>
<tr><td>පැමිණීමේ ලේඛන</td><td>450</td><td>06</td><td>2700/-</td></tr>
<tr><td>සභා වාර්තා අලවන ලේඛන</td><td>700</td><td>05</td><td>3500/-</td></tr>
</table></td><td>87</td><td>651917</td><td>85720.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | වරිපනම් කාඩ් \| 15 \| 5000 \| 75000/- | | | |
| 2010/02/02 | එම්.ඒ.එන්.ප්‍රේමතිලක<br>දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගීවීම වෙනුවෙන් වියදම් දීමනා | 01 | 651920 | 50000.00 |
| | දෙශීය ආදායම් කොමසාරිස්<br>2009 ඔක්තෝබර් මාසයේ එකතු කල අගය මත බදු ගෙවීම | 03 | 651922 | 107120.00 |
| | දේශීය ආදායම් කොමසාරිස්<br>2009 නොවැම්බර් මාසයේ එකතු කල අගය මත බදු ගෙවීම | 04 | 651922 | 17791.95 |
| | බී.ගුණරත්න<br>2010.01.16 සිට 2010.01.31 දින දක්වා නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් කම්කරුවන් යෙදවීම | 05 | 651923 | 100583.33 |
| | වජිර සංජීව වීජේකෝන්<br>බළන්ගොඩ නගර සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් 20% අත්තිකාරම් ගෙවීම | 06 | 651924 | 55000.00 |
| | සභාපති , විජනත්කුඹුර විජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>ඇල්ලෙපොල පල්ලෙකුඹුර ගල් බැම්මගොඩහේන පළමු අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය<br>10% රැඳවුම් ගෙවීම 45520.58<br>ගිවිසුම් ඇප තැන්පත් 24402.00 | 09 | 651927 | 69922.58 |
| 02/03 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 ජනවාරි මාසයේ විදුලි බිල පියවීම<br>කාර්යාලය 18726.00<br>නගර සභාවට යාබඳ<br>ගොඩනැගිල්ල 825.00 | 10 | 651928 | 19551.00 |
| | රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි<br>2010 වර්ෂය සඳහා ගැසට් පත්‍ර මිළදී ගැනීම | 12 | 651929 | 16890.00 |
| | කළමනාකරු , ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>2010 ජනවාරි මාසයේ ජලබිල පියවීම<br>පොදුවෙළඳසැල 14778.40<br>පිංතාලිය 1467.20<br>තානායම 6188.60 | 13 | 651930 | 22434.20 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 16 | 651932 | 12786.08 |
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බළන්ගොඩ කල්තොට පාර කුමාරගම 1 පටුමග අඩි 375 සංවර්ධනය කිරීම කර්මාන්තය<br>10 රැඳවුම් 49517.88<br>ගිවිසුම් ඇප තැන්පත් 24759.00 | 17 | 651934 | 74276.88 |
| 02/09 | තාවකාලික වැටුප් - කර්මාන්ත අංශය<br>තානායමේ මායිම් තාප්පය ඉදිකිරීම 56250/-<br>කොටුගොඩැල්ල පාර ශුද්ධ කිරීම 3000/-<br>තානායම අලුත්වැඩියාව 21250/-<br>බෝම්බුව ආචාරිමලේ පාර ශුද්ධකිරීම 3000/- | 18-1 | 651935 | 83500.00 |

<table>
<tr><td>02/11</td><td>එම්.ගාමිණී<br>37-7933 ට්‍රැක්ටරයේ දිරාගිය කොටස් නැවත අලුත්වැඩියා කිරීම , පින්තාරු කිරීම , වයර් පද්ධතිය අලුත්වැඩියාව , ගැස්කට්,වේග මීටරය, කේබල් අලුතින් සවිකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>19</td><td>651945</td><td>42300.00</td></tr>
<tr><td></td><td>ජයන්ති ටයර් සෙන්ටර්<br>එන්.ඩී.5124 වෑන් රථයට 195x15<br>ප්‍රමාණයේ බ්‍රිජස්ටන් ටයර් 04 සඳහා<br>ටයර් 01 මිළ 15400.00<br>ටයර් 04 සඳහා 15400x4</td><td>20</td><td>651944</td><td>61600.00</td></tr>
<tr><td>2/11</td><td>ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>ජල බවුසරයේ දිරාගිය කොටස් වැල්ඩින් කර තීන්ත ආලේප කර අකුරු ඇඳ ලයිට් අලුතින් දැමීම</td><td>22</td><td>651947</td><td>31180.00</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 දෙසැම්බර් මස රඳවා ගැනීමේ බදු මුදල්<br>දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරිම</td><td>29</td><td>651954</td><td>148710.16</td></tr>
<tr><td>02/11</td><td>ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>බෝම්බුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය වටා බැම්ම බැඳ දැල් ආවරණය කිරීමේ කර්මාන්තය සඳහා ඉදිකිරීම් උපාංග ලබාගැනීම
<table>
<tr><th>විස්තරය</th><th>ඒකක මිල</th><th>ප්‍රමාණය</th><th>වටිනාකම</th></tr>
<tr><td>11/4 ජීඅයි බට</td><td>2300/-</td><td>08</td><td>18400.00</td></tr>
<tr><td>2" ජීඅයි බට</td><td>3500/-</td><td>4 1/2</td><td>15750.00</td></tr>
<tr><td>2x2 දැල් රෝල්</td><td>22500/-</td><td>03</td><td>67500.00</td></tr>
<tr><td>ඇන්ටි කොරෝසු</td><td>460/-</td><td>7 ලි.</td><td>3220.00</td></tr>
<tr><td>ජේ හුක්ස්</td><td>212/-</td><td>7 කි.ග්‍රෑ.</td><td>1484.00</td></tr>
<tr><td>තිනර්</td><td>200/-</td><td>03 ලි.</td><td>600.00</td></tr>
<tr><td>1/2 ඇන්කබෝල්ට්</td><td>65</td><td>06</td><td>390.00</td></tr>
</table></td><td>30</td><td>651953</td><td>107344.00</td></tr>
<tr><td>02/11</td><td>බලගහමුල සමෘද්ධි සමිතිය<br>සරස්වතීවත්ත පාර කනත්ත ඉහල කොටස කාණුව ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවිම</td><td>31</td><td>651955</td><td>249010.00</td></tr>
<tr><td>02/06</td><td>බුලත්ගම සුහඳ ග්‍රාම සංවර්ධන සමිතිය<br>කොටුගොඩැල්ල වෑකුඹුර කැකුණගහමුල්ල දක්වා මාර්ගය බැම් බැඳ සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම</td><td>34</td><td>651959</td><td>251690.81</td></tr>
<tr><td></td><td>සභාපති , බලගහමුල සමෘද්ධි සමිතිය<br>සරස්වතීවත්ත පාර පළමු පඩිපෙළ මැද කොටස ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම</td><td>35</td><td>651960</td><td>93456.55</td></tr>
<tr><td>2/12</td><td>එම්.ජී.පියසේන<br>2010 ජනවාරි මාසයට අදාළව පෞද්ගලික බස්ගාල් ගාස්තු වශයෙන් අයකර තැන්පත් ලෙස තබා ඇති මුදල් ආපසු ගෙවීම.</td><td>38</td><td>652964</td><td>18000.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය කුමාරගම ii පටුමග කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 39 | 652965 | 200868.05 |
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය පුවක්ගහමුල්ල මාර්ගය අඩි 55 දුර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 40 | 652966 | 50000.00 |
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය බුලත්ගම නිශාන්ත මහතාගේ ගරාජය අසල පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 41 | 652966 | 256071.29 |
| | උෂා ප්‍රදර්ශනාගාරය පෙර පාසල් ගොඩනැගිල්ල සඳහා සිවිලින් ෆෑන් 02 ලබාගැනීම | 42 | 652967 | 10800.00 |
| | ලංකා බැංකුව | | | |
| 2010.02.03 | දේශීය ආදායම් කොමසාරිස් 2009 නොවැම්බර් මස එකතු කල අගය මත බදු ගෙවීම | 01 | 800685 | 11449.50 |
| | දේශීය ආදායම් කොමසාරිස් 2009 ඔක්තෝබර් මස එකතු කල අගය මත බදු ගෙවීම | 02 | 800685 | 11139.00 |
| 02/03 | කළමනාකරු , ජාතික ජල සම්පාදන මණ්ඩලය 2010 ජනවාරි මාසයේ නව බස්නැවතුම්පලේ ජල බිල පියවීම | 03 | 800686 | 39605.20 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය 2010 ජනවාරි මාසයේ නව බස්නැවතුම්පලේ විදුලි බිල පියවීම. | 04 | 800687 | 62476.20 |

ඉහත සඳහන් මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම :**

ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් නොවීය.

**08.1 යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා :**

නැත.

**09. ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම**

09:01 **H.F.8558 ට්‍රැක්ටරයේ අළුත්වැඩියා කටයුතු :**

ඉහත අංක දරණ ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා ඩිපෝ ඉංජිනේරු මහතාගෙන් ලබාගත් තත්ව වාර්තාව අනුව අදාළ අළුත්වැඩියා කටයුතු සඳහා මිළ ගණන් කැඳවන ලදී. අදාළ මිළ ගණන් පහත දැක්වේ.

| නැෂනල් මෝටර්වේස් | **තෙබුවන ගරාජය** | වික්‍රමසිංහ ගරාජය |
|---|---|---|
| රු.25000/- | **රු.23727/-** | රු.26575/- |

මෙම මිළ ගණන් අතුරින් තෙබුවන ගරාජය අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති බැවින් , එම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **ජල බවුසර් දෙක සඳහා අඟල් 01 හෝස් අඩි 100 ක් මිළදී ගැනීම:**

මෙම නගර සභාව සතු ජල බවුසර් දෙකේ පාවිච්චිය සඳහා අවශ්‍ය 1" හෝස් අඩි 100 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| **කැළණි ඒජන්සීස්** | ලංකා කොමඩිටි එක්ස්චේන්ජ් පුද්ගලික සමාගම | ටී සිලෝන් හෝල්ඩිංග්ස් |
|---|---|---|
| **රු.23320/-** | රු.23640/- | රු.23560/- |

ඉහත සඳහන් මිළ ගණන් අතරින් " කැළණි ඒජන්සීස් " ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:03 **226-7521 ටිපර් රථයට ටයර් මිළදී ගැනීම:**

ඉහත අංක දරණ ටිපර් රථයට 700x16 ටයර් 02 ක් ( ඉදිරිපස ) මිළදී ගැනීමට කැඳවන ලද මිළ ගනන් පහත දැක්වේ.

| සිටි ටයර් සර්විස් | **ජයන්ති ටයර් සෙන්ටර්** | බළන්ගොඩ ටයර් සර්විස් |
|---|---|---|
| රු.24200/- | **රු.23800/-** | රු.24000/- |

මෙම මිළ ගනන් අතුරින් " ජයන්ති ටයර් සෙන්ටර් " ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:04 **G.K.1483 ට්‍රැක්ටරයට ඇම්පියර් 90 බැටරියක් මිළදී ගැනීම:**

G.K.1483 ට්‍රැක්ටරයට ඇම්පියර් 90 බැටරියක් මිළදී ගැනීමට කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| **ජයන්ති ටයර් සෙන්ටර්** | බළන්ගොඩ ටයර් සර්විස් | සිටි ටයර් සර්විස් |
|---|---|---|
| **රු.12900/-** | රු.13100/- | රු.13000/- |

ඉහත මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කරඇති " ජයන්ති ටයර් සෙන්ටර් " ආයතනයේ රු.12900/- ක් වු මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:05 **226-7521 ටිපර් රථය අළුත්වැඩියා කිරීම:**

ඉහත අංක දරණ ටිපර් රථයේ දුනුබුෂ් හා යසිලන්සර් බුෂ් අළුත්වැඩියා කිරීමට ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| නැෂනල් මෝටර්වේස් | **තෙබුවන ගරාජය** | වික්‍රමසිංහ ගරාජය |
|---|---|---|
| රු.25000/- | **රු.22940/-** | රු.25315/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති තෙබුවන ගරාජයේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:06 **<u>ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම:</u>**

බළන්ගොඩ නගර සභාවේ පෙර පාසල සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ මිළදි ගැනීම වෙනුවෙන් කැඳවූ මිළ ගණන් පහත දැක්වේ.

| | **ලලන්ස් ස්පෝට්ස් ගුඩ්ස්** | ගයාන් බිල්ඩර්ස් | එන්.එල්.ඊ.ඉන්ජිනියර් | රත්නපුර වෙල්ඩ් ටෙක් | කට්ලීන් එන්ටප්‍රයිසස් |
|---|---|---|---|---|---|
| ෆයිබර් ආසන සහිත ද්විත්ව ඔංචිල්ලාව | **28448/-** | 32850/- | 35925/- | 29500/ | 31450/- |
| ෆයිබර් ආසන සහිත රවුන්ඩ් සර්කියුලර් | **74524/-** | 88900/- | 84625/- | 85250/- | 79300/- |
| බෝල් හවුස් | **318808/-** | 378600/- | 352550/- | 325000/- | 345500/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති " ලලන්ස් ස්පෝට්ස් ගුඩ්ස් " ආයතනය වෙතින් අදාල ක්‍රීඩා භාණ්ඩ ප්‍රමාණය මිළදී ගැනීමට සභාව තීරණය කරන ලදී.

09:07 **<u>තානායමේ ජනෙල් සඳහා ග්‍රිල් ගැසීම</u> :**

| | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් , වැගපිටිය, මොරහැල ,බළන්ගොඩ** | පී.එම්.සී..... සචී මෝටර්ස්, වැගපිටිය, මොරහැල | හංසිකා වුඩ්වර්ක්ස වැගපිටිය,මොරහැල | නාලක කන්ස්ට්‍රක්ෂන්ස් නාලක කටුපිටිය මොරහැල | කේ..කන්ස්ට්‍රක්ෂන්ස් නව බස්නැවතුම්පල බළන්ගොඩ |
|---|---|---|---|---|---|
| 12 මි.මෘදුවානේ කම්බි වලින් ජනෙල් ග්‍රීල් ගැසීම සඳහා ( වර්ග අඩි 479.75 ) | **129532/-** | 133000/- | 134000/- | 135750/- | 148722.50 |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් ආයතනයේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:08 **<u>තානායම භූමියේ පිහිටි අනතුරුදායක කොස්ගස ඉවත්කිරීම:</u>**

බළන්ගොඩ තානායම් භූමියේ සිදුකරනු ලබන ඉදිකිරීම් වලට අවහිරව සහ අනතුරුදායකව පවතින දිරායාමට පත්ව ඇති කොස්ගස මිළදීගෙන ඉවත් කරගෙන යාම සඳහා මිළ ගණන් කැඳවන ලදී. අදාළ මිළ ගණන් පහත දැක්වේ.

| **නම** | **<u>මුදල</u>** |
|---|---|
| 01. ඩබ්.සී.ජයනාත් මයා , 1/243, ඇල්ලෙපොල,බලන්ගොඩ | 3500/- |
| 02. ඩබ්.වී.කුමාරසිරි මයා, ඇල්ලෙපොල,බළන්ගොඩ | 4000/- |

| | |
|---|---|
| 03. එම්.ඩබ්.සරත් කුමාර මයා , සරස්වතී හන්දිය,බළන්ගොඩ | 3000/- |
| **04. ඒ.එම්.එම්.නසීර් මයා , 25/27, නව බස්නැවතුම්පල පාර, බලගහමුල , බළන්ගොඩ.** | **5000/-** |

මෙම මිළ ගණන් අතුරින් වැඩිම මිළ ගණන ඉදිරිපත් කර ඇති බළන්ගොඩ , බලගහමුල ඒ.එම්.එම්.නසීර් මහතාගේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

**10. යෝජනා :**

**10:01 ගරු සභාපති , ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

මෙම සභාවේ රියදුරෙකු ලෙස සේවය කරන එච්.රොමියෙල් මහතා අසනීප තත්ත්වයෙන් පසුවන නිසා , සැහැල්ලු සේවයකට යොදවන මෙන් ඉල්ලීමක් කර ඇති බැවින් , ඒ සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව , මොහු සැහැල්ලු සේවයකට යෙදවීමෙන් කාර්යාලයේ රියදුරු ප්‍රශ්නය තවත් උග්‍රවන බැවින් , මොහු වෙනුවට වෙනත් ආදේශක රියදුරෙකු බඳවාගෙන , මෙම රියදුරු මහතා සැහැල්ලු සේවයකට යෙදවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන යටතේ 2010 වර්ෂය සඳහා මෙම සභාව වෙත ලක්ෂ 20 ක මුදලක් වෙන් වී ඇති අතර , එම මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කරන ලෙස උපදෙස් ලබාදී තිබුණ ද, මෙම මාර්ගහි පිහිටීම අනුව කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීම කළනොහැකි බැවින් , මාර්ග කොන්ක්‍රීට් කිරීමට මහා මාර්ග අමාත්‍යාංශයෙන් ඉල්ලිමක් කල බවත් , නමුත් ඒ සඳහා අනුමැතිය නොලැබුණු බැවින් , එම මාර්ග පිළිගත් සමිති වෙත කොන්ත්‍රාත් ලබාදී කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.

මෙම සභාවේ ගරු උපසභාපතිතුමා අසනීප තත්ත්වයෙන් පසුවන නිසා , අද දින දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගීවිය නොහැකි බව දුරකථනයෙන් දැණුම්දුන් බැවින් නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී. එම යෝජනාව අනුව නිවාඩු අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

**10:02 ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

බළන්ගොඩ කුමාරගම ii පටුමග ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා මුදල් ලබාදෙන යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව අනුව ඇස්තමේන්තු සකසා එය ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

**10:03 ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

බුලත්ගම දෙමළ විද්‍යාල පාර වලවල් සෑදී අබලන් වී ඇති බැවින් , එය ප්‍රතිසංස්කරණය කල යුතු බවට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාර්යාල නවීකරණය යටතේ මෙම සභාවෙන් ඉවත්කල මේස,පුටු ආදිය ප්‍රදේශයේ පොදු ආයතන වලට ලබාදීමට සභා තීන්දුවක් ගෙන ඇති බැවින් , කඩිනමින් එවා අදාල ආයතන වෙත ලබාදීම සුදුසු යැයි යෝජනා කරන ලදී.

මෙම සභාවේ ගරු උපසභාපතිතුමා විසින් කොම්පෝස්ට් පොහොර මිළදී ගැනීම සහ ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාවන් ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවිය යුතුව තිබෙන අතර මෙම කාරණය විගණන විමසුමකට ද ලක්ව ඇති බැවින් , ඒ සම්බන්ධව දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක්දැයි විමසීය. ( අදාල මුදල් අයකරගැනීම සඳහා ගරු උපසභාපතිතුමා වෙත ලිඛිතව දැණුම්දීමක් සිදුකර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.)

10:04 **ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමාඃ**

බළන්ගොඩ වෑකුඹුර කැකුණගහමුල්ල මාර්ගය සංවර්ධනය සඳහා ලක්ෂ 02 ක මුදලක් වෙන්කර එම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

10:05 **ගරු නාගරික මන්ත්‍රී , ඒ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා ඃ**

කිරිඳිගල ජනපද පාර දෙපස කැලය ශුද්ධ කිරීම හා රබර්වත්ත පාර නාය ගිය කොටසෙහි ඉතිරි කොටස සකස් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී. එම යෝජනා ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**11. කාරක සභා වල වාර්තා සලකා බැලීමඃ**

**11:01** 2010.02.03 වන දින පවත්වන ලද කර්මාන්ත කමිටුවේ වාර්තාව හා 2010.02.17 වන දින පවත්වනු ලැබූ මුදල් කමිටුවේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාවන් අධ්‍යයනය කල සභාව , එම වාර්තා අනුමත කරන ලදී.

11:02 2009 වර්ෂය සඳහා සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදුන් අතර , වෙන්දේසි කලයුතු භාණ්ඩ තක්සේරු කර , 2010.03.17 වන දින පෙ.ව.10.00 ට නගර සභා කාර්යාල පරිශ්‍රයෙහිදී වෙන්දේසි කිරීමට තීරණය කරන ලදී.

අංකඃ N.D.5124 දරණ වෑන් රථයෙන් ඉවත් කල ටයර් 08 ක් ගබඩාවේ තිබෙන බැවින් , එම ටයර් 08 ද වෙන්දේසි කිරීමට තීරණය කරන ලදී.

11:03 මෙම නගර සභාවේ ක්‍රියාකාරී සැලැස්ම හා ත්‍රෛයිමාසිකව නිකුත් කිරීමට අදහස් කර න " අරුණළු " සඟරාවේ පිටපතක් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙය අධ්‍යයනය කල සභාව , නගර සභාව මගින් සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වල තොරතුරු ජනතාව අතරට රැගෙන යාම සිදුවන බැවින් මෙය කලෝචිත පියවරක ආරම්භයක් බව සඳහන් කරන ලදී. මන්ත්‍රීවරුන් සියළු දෙනා විසින්ම කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලට අදාල තොරතුරු හා ඡායාරූප ඇතුළත් කිරීම සිදුවිය යුතු බව පෙන්වා දෙන ලදී. නගරයේ පාසල් වලට ද මෙම සඟරාව ලබාදීම සුදුසු බවත් සාකච්ඡා විය.
අදාළ සඟරාව මුද්‍රණය කිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීමඃ**

2010 වර්ෂයේ ජනවාරි මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 5,592,908.00 |
| වෙනත් ලැබීම් | 1,241,148.00 |
| | ----------- |
| මුළු ලැබීම් | 6,834,056.00 |
| | |
| පුනරාවර්ථන වියදම් | 1,985,688.35 |
| වෙනත් වියදම් | 11,516,665.27 |
| | ------------- |
| මුළු වියදම් | 13,502,353.62 |
| | ========= |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2009.11.01 දින සිට 2009.11.30 දින දක්වාත් 2009.12.01 සිට 2009.12.30 දක්වාත් මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව , එම වාර්තා සභාව විසින් අනුමත ලදී.

13. **වෙනත් කරුණු :**

නැත

14. **අවසානයඃ-**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.